



**වෘත්තීය ජීවිතය**

1973 ඉන්දියානු විදේශ සේවයට බැඳුණු කණ්ඩායමේ ප්‍රථමයා වූයේ නිරූපමාය. ඇය හැත්තෑව දශකයේ මැදදී ඔස්ට්‍රියාවේ වියානා හි ඉන්දියානු තානාපතිනිය ලෙසින් කටයුතු කළාය.

චීනය සමග ඉන්දියානු සබඳතා වර්ධනය කිරීමෙහිලා නිරූපමා කැපී පෙනෙන මෙහෙයක් සිදු කළාය. 1988 වසරේ දෙසැම්බර් මාසයේදී රජීව් ගාන්ධි චීනයේ බීජිං නුවර සිදුකළ ඓතිහාසික චාරිකාව ඇයගේ වෘත්තීය ජීවිතයේ අමරණීය සිදුවීමකි.
තානාපතිනියක ලෙස ඇය මුලින්ම කටයුතු කළේ පේරු රාජ්‍යයේය. චීනයේ පළමු ඉන්දීය තානාපතිනිය ද නිරූපමා රාඕය.

**ලේඛන කලාව.**

භාරතය කලාගාරයකි. මෙවන් භූමියක උපන් ඇයද කලා හැකියාවන් දෝතින් දරා උපන්නියකි. "කවිය" ඇයගේ නිර්මාණාත්මක හැකියාව ප්‍රදර්ශනය කරන මාධ්‍යයි. "රේන් රයිසිං" නමින් ඇය ලියූ කාව්‍ය සංග්‍රහය චීන බසට සහ රුසියානු බසටද පරිවර්තනය කර තිබේ.

**පෞද්ගලික ජීවිතය.**

නිරූපමාගේ සැමියා සුධාකර් රාඕය. ඔහුත් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය පරිපාලන නිළධාරියෙකි. ඉන්දියානු පරිපාලන සේවයේ කැපී පෙනෙන, අල්ලස් වැනි විවිධ චෝදනා වලට ලක් වූ නිලධාරියෙකි. නිරූපමාටත්, සුධාකර්ටත් සිටින්නේ පුතුන් දෙදෙනෙකි.

මෙම වසරේ දෙසැම්බර් හය වැනි දිනට නිරූපමා හැට වැනි විය සම්පූර්ණ කරන්නීය. එහෙත් තවමත් ඇය තාරුණ්‍යයෙන් පිරිපුන් භාරතයට නැතිවම බැරි ඉහළම පෙළේ රාජ්‍ය පරිපාලන නිලධාරිනියකි.

**චමිපිකා දීපානි රණසිංහ ලියයි.**



# දිරියෙන් ලොව ජයගත්
# ජෙන්සිලා මජීඩ්



MAJEED JENSILA

තමන්ගේ පදිංචිය අහිමි වූ විට කෙනෙකුට දැනෙන වේදනාව වචනවලින් පැවසිය නොහැකිය. කෙනෙකු එපමණටම අසරණ කරන තත්වයේදීත් නැගී සිටිය හැක්කේ හොඳ ආත්ම ශක්තියක් ඇති අයකුට පමණයි.

ජෙන්සිලා මජීඩ් එවැන්නියකි. 1990 වසරේ දී ද්‍රවිඩ ත්‍රස්තවාදී ප්‍රහාරයකින් අවතැන් වුණු ඇය තවමත් තමන්ට කියා තැනක් නොමැතිව සැමියා හා දරු දෙදෙනා සමග පුත්තලමේ පදිංචිව සිටින්නීය. ජෙන්සිලා මුලතිව් හි පදිංචිකාරියකි. ඇය සැමියාගේ සහයෝගය ලබාගෙන කඳවුරේ සිටින දෙමළ හා මුස්ලිම් කාන්තාවන් පස් දෙනෙකු එක්රැස් කර මහජන විශ්වාසයේ පදනම බිහි කළාය.

එමගින් කාන්තා අයිතිය, සාමය, අධ්‍යාපනය වෙනුවෙන් වැඩසටහන් ගණනක් ක්‍රියාත්මක කරන අතර දැන් ජෙන්සිලාගේ කණ්ඩායමට තරුණ පිරිසගේ සහය ද නොමඳව ලැබේ.
ඇය 2010 වසරේ දිරිය කාන්තාව ලෙස නම් කෙරුණේ මහජන විශ්වාසයේ පදනම මගින් කරන ලද එම අභිවිශිෂ්ට සේවාවටයි. ඇමරිකානු රජයෙන් ලොව සේවයක් කරන කාන්තා නායකත්වයට වාර්ෂිකව ලබාදෙන එකම ත්‍යාගය වන මෙය අපේ රටේ සහෝදර මුස්ලිම් කාන්තාවකට හිමිවීම ආඩම්බරයට කරුණකි.
විශේෂයෙන්ම මෙහි වටිනාකම වැඩිවන්නේ මුස්ලිම් කතකට මහජන හෝ සමාජ කටයුතුවල යෙදීම අභියෝගයක්ව තිබියදීත් මෙවැනි ජයග්‍රහණයක් ලැබීම නිසයි. ජෙන්සිලාට අමතරව ඇෆගනිස්ථානයේ ෂුක්‍රියා අසීල් සහ ශේකා කුරෙයිෂි ද සම්මානයට පාත්‍ර විය. ඔවුන් දෙදෙනා ද මුස්ලිම් කාන්තාවන් වීම සුවිශේෂී කරුණකි.

ඇමරිකාව මෙම සම්මානය පිරිනමන්නේ 2007 වර්ෂයේ සිටය.